## නේවාසික ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලය - මුරපොල ඇල
## வதிவிட திட்ட முகாமையாளர் காரியாலையம் – முரபொலஎல
## Resident Project Management Office – Murapola Ela


වාරිමාර්ග කළමනාකරණ අංශය නීලවල
நீர்ப்பாசன முகமைத்துவ பிரிவு
කොළඹිස්ස
**Irrigation Management Division**
நீலவல

වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය கொலம்பி];]
நீர்ப்பாசனம் மற்றும் நீர் முகாமைத்துவ அமைச்சு
Neelawala
**Ministry of Irrigation & Water Resources Management**
Kolambissa


---

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My Ref No — 36/3/1 | ඔබේ අංකය / உமது இல. / Your Ref No — | දිනය / திகதி / Date — 2016/07/20 |

රැස්වීමේ නම - ව්‍යාපාර කළමනාකරණ කමිටුව
දිනය හා වේලාව - **2016/07/15 දින පෙ.ව.10.00**
මුලසුන - නේවාසික ව්‍යාපෘති කළමනාකරු, මුරපොල ඇල මහා වාරිමාර්ග ව්‍යාපාරය
සහභාගිත්වය - රේඛිය ආයතන හා ගොවි සංවිධාන

<u>රජයේ නිලධාරින්ගේ සහභාගිත්වය</u>

- එස්.එස්.බී. ජයසිංහ මයා — ප්‍රාදේශීය ලේකම් දෙල්තොට
- එම්.ජී.ඩී. බණ්ඩාර මයා — නේවාසික ව්‍යාපාර කළමනාකරු
- ඩී.එම්.එස්.එන්.ටී. ජයසේකර මයා — සහකාර ප්‍රාදේශීය ලේකම් දෙල්තොට
- එම්.ජී.ඩී. බණ්ඩාර මයා — නේවාසික ව්‍යාපාර කළමනාකරු
- ජී.පී.ඩී.එස්. අමරසූරිය මිය — ආයතන සංවර්ධන නිලධාරි
- ඩී.එම්.ආර්.පී. කුමාර මයා — සංවර්ධන නිලධාරි
- ඩී.ජී.ජේ.එන්.කුමාරි මිය — සංවර්ධන නිලධාරි (පුහුණු)
- එස්.එන්. විමලසුරේන්ද්‍ර මයා — ඉංජිනේරු සහකාර
- එච්.එම්.ගාමිණී බණ්ඩාර මයා — පරිපාලන ග්‍රාමනිලධාරි
- ඊ.ආර්.එන්.එන්.ජයකොඩි මයා — කෘෂිකර්ම උපදේශක මාරස්සන
- ඩබ්.ආර්. උදයංගනී මිය — සංවර්ධන නිලධාරී(කෘෂිකර්ම) දෙල්තොට
- ආර්.එම්.ඩී.ඩී.කේ. රත්නායක මයා — සංවර්ධන නිලධාරි(කෘෂිකර්ම)

<u>ගොවි නියෝජිතයින්ගේ සහභාගිත්වය</u>

- ආර්.එම්. සුමනරත්න බණ්ඩා මයා — කහඹිලියාව ගොවි සංවිධානය - ගරු සභාපති
- කේ.ජී.එම්.වික්‍රමරත්න මයා — ගුරුබැද්ද ගොවි සංවිධානය - ගරු ලේකම්
- කෙ.එල්.නිමල් ජගත් මයා — ගුරුබැද්ද ගොවි සංවිධානය - ජල පාලක
- ජේ.එම්. පුංචි බණ්ඩා මයා — කොටගේපිටිය ගොවි සංවිධානය - ගරු ලේකම්

- ජී.ජී. දිසානායක මයා කොටගේපිටිය ගොවි සංවිධානය - ගරු භාණ්ඩාගාරික
- එස්.එම්. වීරකෝන් බණ්ඩා මයා දෙහල්කඩ ගොවි සංවිධානය - ගරු භාණ්ඩාගාරික
- ඊ.ඒ. ජයමංගල මයා ජලපාලක
- කේ.ජී. විමලාවතී මිය කොටගෙපිටිය ගොවි සංවිධානය - ගරු සභාපති
- ආර්.බී. කොලුගල මයා නීලවල ගොවි සංවිධානය -ගරු භාණ්ඩාගාරික
- යූ.බී. විජේසේකර මයා මකුලයටතැන්න ගොවි සංවිධානය -ගරු සභාපති
- එම්.එම්. සමරකෝන් බණ්ඩා මයා ගුරුබැද්ද ගොවි සංවිධානය -ගරු සභාපති
- ආර්.ඒ.පී. විජේනාරායන මයා නීලවල ගොවි සංවිධානය - ගරු සභාපති
- බී.පී.ජී. දයාවතී මිය කහඹිලියාව ගොවි සංවිධානය -ගරු ලේකම්
- අයි.එම්.එම්.සුසිලා ධනවංශ මිය මයිලගහයාය ගොවි සංවිධානය - සාමාජික
- එම්.එම්. සුනිල් ශාන්ත මයා ගිරාඹේ ගොවි සංවිධානය - ගරුසභාපති
- එම්.එම්. රණසිංහ බණ්ඩා මයා ගුරුබැද්ද ගොවි සංවිධානය -ගරු සභාපති
- එච්.එම්. සමරකෝන් මයා සාමාජික

ආගම සිහි කිරීමෙන් හා ආදි ගොවි නායකයන් හා නිළධාරීන් සිහි කිරීමේ විනාඩියක නිශ්ශබ්දතාවයෙන් අනතුරුව නේවාසික ව්‍යාපාර කලමනාකාරතුමා විසින් පැමිණ සිටි සියලු දෙනා පිළිගැනීමෙන් සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදි.

<u>ගැටලු/යෝජනා/ප්‍රගතිය ඉදිරිපත් කිරීම</u>

| අංකය | ආයතනය | කාරණය/තීරණය/ප්‍රගතිය |
|---|---|---|
| 01 | නේවාසික ව්‍යාපාර කළමනාකරු, මුරපොල ඇල ව්‍යාපාරය. | • කොටගේපිටිය මහා සභාවේදී ගොවීන් විසින් වැඩි මිලට පොහොර අලෙවි කිරීම පිළිබඳ ඉදිරිපත් කෙරුණු කරුණු අනුව පොහොර ලේකම් කාර්යාලය දැනුම්වත් කළ බවත්, ඒ පිළිබඳ පරීක්ෂාවක් සිදුකර ඇති බවත්, එහිදී,<br>• මිශ්‍ර පොහොර රු.2500ට වඩා වැඩි වන බවත් (අමතර පිරිවැයක් දරන නිසා)අමිශ්‍ර පොහොර රු.2500ට අලෙවි කර ඇති බවත් දක්වා ඇත<br>• කාබනික පොහොර නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩ සටහනක් සංවිධානය කළ හැකිය. ඒ සඳහා ගොවීන් දැනුම්වත් කරන්න.<br>• ව්‍යාපාර කලමනාකරණ කමිටුවේදී ගනු ලබන තීන්දු තීරණ හා දැනුම්වත් කිරීම් අදාල නිලධාරී මණ්ඩලය විසින් සියලුම ගොවීන් දැනුම්වත් කිරීමට වග බලා ගත යුතුය.<br>• වගාවන්ට පවතින හානි පිළිබඳ උපදෙස් අවශ්‍ය ඕනෑම අවස්ථාවක කෘෂිකර්ම උපදේශක මහතාගෙන් ලබා ගැනීමට උනන්දු වන්න. |

| | | |
|---|---|---|
| | ආයතන සංවර්ධන නිලධාරි | <u>ආයතන සංවර්ධන කටයුතු</u><br>• ගොවි සංවිධාන 05 ක පහත පරිදි නිල කාලය අවසන් වන බව<br>නවනැලිය ගොවි සංවිධානය 2016/05/19<br>මකුලයටතැන්න ගොවි සංවිධානය 2016/06/20<br>වටපඳුර ගොවි සංවිධානය 2016/05/08<br>මයිලගහයාය ගොවි සංවිධානය 2016/06/30<br>දෙහල්කඩ ගොවි සංවිධානය 2016/05/21<br><br>එදිනෙන් පසු එහි බලය අවසන් වන බවත් මාස 03 ක සහන කාලයක් පවතින බවත් හැකි ඉක්මනින් නිලවරණ සඳහා දින නියම කරගන්නා ලෙසත් දන්වා සිටියේය.<br><br>• ඉදිරි ව්‍යාපාර කමිටුවේදී ඒකාබද්ධ ගොවි සංවිධානයේ නිලවරණය පැවැත්වීමට සූදානම් කරගන්නා ලෙසත්,ඒකාබද්ධ ගොවි සංවිධානයට අරමුදලක් ඇති කරගනිමින් එය ශක්තිමත් කරන ලෙසත් දන්වා සිටියේය.<br>• ගිණුම් කටයුතු සහ නීතිමය බලතල පිළිබඳ ගොවීන් දැනුවත් කිරීමේ වැඩමුළුවක් ඉදිරියේදි පැවැත්වීමට බලාපොරොත්තු වේ.<br>• මහා සභා පැවැත්විම,නිලවරණ පැවැත්වීම්, කාරක සභා ආදිය මෙන්මමුදල් පොත් පරීක්ෂා කිරීම, ගිණුම් කටයුතු යථාවත් කිරීම ආදියද සිදුවන බව<br>• අභිනවයෙන් තේරී පත් වූ කොටගේ පිටිය ගොවි සංවිධානයේ නව නිලධාරී මණ්ඩලයද සභාවට හඳුන්වා දෙන ලදි. |
| 02 | ප්‍රාදේශීය ලේකම් දෙල්තොට | • දෙල්තොට ප්‍රාදේශීය ලේකම් ලෙස වැඩ භාර ගැනීමෙන් පසු ව්‍යාපාර කළමනාකරණ කමිටුවට සහභාගි වූ පළමු අවස්ථාව මෙය වේ. ඒ පිළිබඳ ව සතුටට පත් වේ.<br>• දැනට ලූල් කඳුර පානීය ජල ව්‍යාපෘතියට අදාලව මිනුම් බැම්මක් ඉදිකර ජලය මැනීම් කටයුතු සිදු කරන බවත්, මෙ හේතුව නිසා වගා කටයුතු සඳහා යම් බලපෑමක් සිදුවේද යන්නත්, 2016/07/12 වන දින නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පැවති දිස්ත්‍රික් නිවාස කෘෂිකර්ම හා පරිසර කමිටුවේදි පුළුල් ලෙස සාකච්ඡා කළ බවත්, ඒ සම්බන්ධයෙන් ගොවීන්ගේ අදහස් විමසීමේ සාකච්ඡාවක් 2016/07/18 වන දින හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී පැවැත්වීමට නියමිත බවත් ඒ සඳහා ගොවි නියෝජිතයන් තිදෙනෙකුට සහභාගි විය හැකි බවත් දන්වා සිටියේය |
| 03 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව ඉංජිනේරු සහකාර | • ජල මුර ක්‍රමය නැවත ජූලි 18 සිට ක්‍රියාත්මක වේ.<br>• සුමිත්‍රා පොඩි මැණිකේ මහත්මියගේ කුඹුරට ජලය ලබා ගැනීමට ඉල්ලුම් කර තිබූ ඇල මාර්ගය සඳහා මුදල් වෙන්වී ඇත.<br>• මකුළුයටතැන්න FC 17 සොරොව්වේ දොර පිළිබඳව පවතින ගැටලුව සඳහා ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදුකර හැකි ඉක්මනින් විසඳුමක් ලබා දෙන |

| | | |
|---|---|---|
| | | බව |
| 04 | ගොවිජන සේවා දෙපාර්තමේන්තුව | • පැමිණ නැත. |
| 05 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව කෘෂිකර්ම උපදේශක - මාරස්සන | • දැනට ගොවීන්ට වගාවන් පිළිබඳව පවතින ගැටලු ඉදිරිපත් කරන ලෙස දන්වා සිටියේය.<br>• පළතුරු, එලවළු කුඩ හා කෘමි දැලක් දෙපාර්තමේන්තුවේ පවතින බව<br>• ගිරාඹේ වෙල්යායේ බෝංචි හේ යෑමේ තත්වයක් පවතින බවත් එයට හේතුව පාදස්ථ කුණුවීමේ රෝගය බැවින් හැකි ඉක්මනින් ඒ පිළිබඳව දැනුම්වත් කරන ලෙසත්,<br>• තක්කාලි සඳහා වැළදෙන හිට මැරීමේ රෝගයට පිළියමක් ලෙස රෝගී ගස් ක්ෂේත්‍රයෙන් ඉවත් කරන ලෙසත්, ගොවීන්ට වගාවන් පිළිබඳව පවතින ඕනෑම ගැටලුවක් පිළිබඳව දැනුම්වත් කරන ලෙසද පැවසීය. |

ගොවි නියෝජිත මහත්ම මහත්මීන්ගේ අදහස්

<u>කොටගේපිටිය ගොවි සංවිධානය- ගරු ලේකම්</u>

- 95% ක් පමණ එළවළු වගා කර ඇති බවත් ,විශේෂ රෝග තත්වයන් නොපවතින බවත්, ආයතන සංවර්ධන නිලධාරි විසින් සිදුකරන ලද මත් ද්‍රව්‍යය නිවාරණය පිළිබඳ දේශනය කාලීන වශයෙන් ඉතාම වැදගත් මෙන්ම හරවත් දේශනයක් බව,
- ජාතික ගොවි සමුළුව වෙනුවෙන් සහභාගී වී ආපසු එන විට අතරමගදී අනතුරට ලක්වී මේ වන විටත් අසනීප තත්වයේ සිටින ඩබ්.එම්.දයා බණ්ඩා මහතාට ගොවි සංවිධාන මට්ටමින් යම් සහයෝගයක් ලබා දිය යුතු බවත්, ඒ සඳහා එක් ගොවි සංවිධානයකින් රු.1000 බැගින් ලබා දීම සුදුසු බවත් පැවසීය.

<u>ගිරාඹේ ගොවි සංවිධානයේ සභාපති</u>

- තක්කාලි හිටු මැරීම,බෝංචි කොළ කොඩවීම,මළකඩ රෝගය හා ගෝවා කෝප්ප රෝගය ආදී රෝග පවතින බව දන්වා සිටියේය.

<u>මකුළුයටතැන්න ගොවි සංවිධානයේ සභාපතිතුමා</u>

- දැනට අස්වැන්න නෙළන බවත්, විශේෂ ගැටලුවක් නොමැති බවත් දන්වා සිටියේය.

<u>නීලවල ගොවි සංවිධානයේ සභාපතිතුමා</u>

- ජනාවාස ඇති වීමත් සමඟ මුරපොල ඇලෙහි ජල ධාරාව අඩු වී ඇති බවත්, වැසි කාලවලදී වර්ෂා ජලය එක් රැස් කරගන්නා ක්‍රමයක් සකස් කර දෙන ලෙසත්, මුරපොල ඇලේ ජල ප්‍රමාණය අඩුවක් සිදු නොවන්නේනම් ලූල් කඳුර ජල යෝජනා ක්‍රමයට විරුද්ධ නොවන බවත්,

- මුරපොල ඇල ව්‍යාපාරයේ ගොවි ජනතාවගේ ගැටලු ඉදිරිපත් කිරීම සඳහා ඒකාබද්ධ ගොවි සංවිධානය ශක්තිමත් කළ යුතු බවත්,ඒ සඳහා ගොඩනඟන අරමුදලට එක් ගොවි සංවිධානයකින් රු.**500**ක මුදලක් සුදුසු බවත්,
- නීලවලට ජල මුර **5-6** අවශ්‍ය බවත් පවසා සිටියේය.

<u>ගුරුබැද්ද ගොවි සංවිධානයේ භාණ්ඩාගාරික තුමා</u>

- තමා සතුව දැනට කිලෝ ග්‍රෑම් **5000**ක පමණ කාබනික පොහොර පවතින බවත්, සම්පූර්ණයෙන් කාබනික වී වගාවකට යොමු විය හැකි බවත්, ජලය ලබා ගැනීමට නොහැකි තත්වයක් පවතින බවත්, ජල ගැටලුවට පිළියමක් ලබා දෙන්නේ නම් ඒ සඳහා සූදානම්
- ගුරුබැද්දට එක් මුරයකට පැය **05**ක් ජලය අවශ්‍ය බවත් ප්‍රකාශ කළේය.

ව්‍යාපාර කළමනාකරණ කමිටු ලේකම්තුමාගේ ස්තුති කතාවෙන් අනතුරුව රැස්වීමේ වැඩ කටයුතු ප.ව **1.30** ට පමණ අවසන් විය.



........................

ගරු ලේකම්,
ව්‍යාපාර කළමනාකරණ කමිටුව,

........................

එම්.ඒ.ඩී.බණ්ඩාර,
ව්‍යාපාර කළමනාකරණ
කමිටුව,